කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යාංශය

**Ministry of Labour and Trade Union Relations**

தேசிய தொழிற் கற்கைகள் நிறுவகம

# වාර්ෂික වාර්තාව

# Annual Report 2015

# வருடாந்த அறிக்கை


ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය

**National Institute of Labour Studies**

தேசிய தொழிற் கற்கைகள் நிறுவகம்

නො 267 පන්නිපිටිය පාර පැලවත්ත බත්තරමුල්ල,

**No 267 Pannipitiya Road Palawatta Battaramulla**

இல.267, பன்னிபிடிய ரோட், பெளவத்த, பத்தரமுள்ள

**ගරු අමාත්‍යතුමාගේ පනිවුඩය**



**කම්කරු හා වෘත්තීය සබඳතා අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය ස්ථාපිත අරමුණු වලට අනුව ශ්‍රම අධ්‍යයන ක්ෂේත්‍රය තුල ශ්‍රමිකයන්ගේ දැනුම සහ කුසලතා වර්ධනය කිරිම සහ ඔවුන් තුල යහපත් ආකල්ප ඇති කිරිම සඳහා මෙම වර්ෂය තුල පුහුණු හා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරිම තුලින් දායකව ඇත.**

**රාජ්‍ය ආයතන, අර්ධ රාජ්‍ය ආයතන මෙන්ම පෞද්ගලික අංශයේ ආයතනවල කාර්ය මණ්ඩල අරමුණු කරගෙන ඔවුන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කරන අතරම ආයතනික ඵලදායීතාවය ඉහළ දැමීම තුළින් යහපත් වැඩ පරිසරයක් ඇති කිරිම සඳහා මෙම වැඩසටහන් හේතු වී ඇති බව විශ්වාස කරමි.**

**මෙම කර්තව්‍ය විධිමත්ව ක්‍රියාත්මක කිරිම සඳහා ජාතිත ශ්‍රම අධ්‍යයන ආයතනයට අළුත් වැඩසටහන් හඳුන්වා දෙමින් පවත්නා වැඩසටහන් නවීකරණය කරගනිමින්, වෙනත් දේශීය අධ්‍යාපන ආයතන මෙන්ම ජාත්‍යන්තර ආයතන සමග සබඳතා ශක්තිමත් කර ගනිමින් හා සිය කාර්ය මණ්ඩල අවශ්‍යතා සම්පූර්ණ කර ගනිමින් ඉදිරියට ගමන් කළ හැකි ඒ සඳහා ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය පෙරමුණ ගෙන කටයුතු කරනු ඇතැයි මම අපේක්ෂා කරමි.**

**ගෙවුනු වර්ෂය තුල ආයතනික ඉලක්ක සපුරා ගනිමින් අමාත්‍යාංශයේ කාර්යභාර්ය සපුරා ගැනිම සඳහා දායක වූ ජාතික ශ්‍රම ආයතනයේ සභාපති, අධ්‍යක්ෂ ජනරාල් ඇතුළු සමස්ථ කාර්ය මණ්ඩලයට මගේ සුබ පැතුම් පිරිනමමි.**

**ඩබ් ඩී ජේ සෙනවිරත්න**
**කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යාංශය**

ගරු සභාපතිතුමාගේ පනිවුඩය



ආයතනවල ඵලදායිතාවය ඉහළ නැංවීම සඳහා මෙන්ම කාර්යස්ථාන වල සේවක අයිතිවාසිකම් ආරක්ෂා කර ගනිමින් යහපත් වැඩ පරිසරයක් ගොඩනගා ගැනීම සඳහා දැනුම හා කුසලතාවයෙන් පිරිපුන් යහපත් ආකල්ප ඇති පිරිසක් අවශ්‍යයෙන්ම සිටිය යුතුය. ජාතික සංවර්ධනය සඳහා කැපවූ තෘප්තිමත් ශ්‍රම බලකායක් ගොඩනැංවීමේ අරමුණට ඵලදායී දායකත්වයක් ලබාදිය හැකිවන්නේ එමඟිනි. ඒ අනුව මිලියන **8.6** ක් වන මේ රටේ ශ්‍රමික ජනතාව ශ්‍රම අධ්‍යයන ක්ෂේත්‍රය ඔස්සේ පුහුණුව හා සංවර්ධනය තුලින් දැනුවත් කිරීමේ භාරදූර කාර්තව්‍යයෙහි ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනයනය නියැලී සිටී. ඒ සඳහා ඩිප්ලෝමා පාඨමාලා, සහතික පත්‍ර පාඨමාලා, වැඩමුළු සහ සම්මන්ත්‍රණ පැවැත්වීම යන පුහුණුව හා සංවර්ධන මෙවලම් ආයතන විසින් ප්‍රයෝජනයට ගෙන ඇත. ඒ ඔස්සේ ඉලක්ක ගත වැඩපිළිවෙලක නියැළී පැහැදිලි ප්‍රවර්ධයන් **2015** වර්ෂය තුල අත් කර ගැනීමට ආයතනය සමත්ව ඇති බව සතුටින් සඳහන් කළ හැකි ය.

වර්ෂය තුළ ඉටු කරන ලද කාර්යභාර්යය සඳහා ආයතනය බාහිර සම්පත්දායකයින්ගෙන් පෝෂණය ලබාගෙන ඇති අතර ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ අනුග්‍රහයද ලබා ගෙන ඇත. එහිදී දෙපාර්තමේන්තු, සංස්ථා සහ ව්‍යවස්ථාපිත ආයතන සහ පෞද්ගලික අංශයේ ආයතන වලින් ලැබී ඇති දායකත්වයද වෙසෙසින් සඳහන් කළ යුතු ය.

2015 වර්ෂය තුල අමාත්‍යාංශය විසින් සපයන ලද නායකත්වය සහ මගපෙන්වීම තුල ඵලදායි ලෙස ඉලක්ක සපුරා ගැනීමට දායක වු ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනයන අධ්‍යක්ෂ ජනරාල් ඇතුළු එහි සිටින කාර්යමණ්ඩලයට ස්තුතිවන්ත වෙමි.

සභාපති
එස් එම් ගෝඨාභය ජයරත්න

## අධ්‍යක්ෂ ජනරාල්ගේ පණිවුඩය



රාජ්‍ය, අර්ධ රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ ආයතනවල පුහුණුව හා සංවර්ධනය කෙරෙහි උනන්දුවක් දක්වන පාර්ශවයන් වෙත සහයෝගය දැක්වීමේ අරමුණ ඇතිව ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය විසින් 2015 වර්ෂය පුරා පාඨමාලා වැඩසටහන් හා වැඩමුළු පැවැත්වීමට කටයුතු කර ඇත. එම පාර්ශවකරුවන් සමග ඇති යහපත් සබඳතා මත ඔවුන්ගේ අදහස් යෝජනා සහ ඉල්ලීම් සැලකිල්ලට ගෙන වැඩසටහන් නවීකරණය කරමින් හා නව වැඩසටහන් හඳුන්වාදෙමින් ඵලදායී ලෙස පුහුණු හා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට ආයතනය පියවර ගෙන ඇත. ඒ යටතට ආයතනය වාර්ෂිකව පවත්වන කම්කරු නීති හා කාර්මික සබඳතා සහ මානව සම්පත් කළමනාකරණ ඩිප්ලෝමා පාඨමාලා, සහතික පත්‍ර පාඨමාලා, වැඩමුළු සහ ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ අනුග්‍රහයෙන් පැවැත්වූ වැඩසටහන මෙන්ම විදේශ රැකියා අමාත්‍යංශයේ නිලධාරීන් සඳහා පැවැත්වූ විශේෂ වැඩසටහන ඇතුලත් වේ. මේ ආකාරයෙන් ආයතනයේ අවධානය, එය ස්ථාපිත කරන ලද අරමුණු වලට අනුකූලව මෙරටේ ශ්‍රම බලකායට ඔවුන්ගේ පෞද්ගලික සහ වෘත්තීය සංවර්ධනයට අවස්ථාව සලසා දෙන අතර ඔවුන්ගේ දැනුම සහ කුසලතා ප්‍රවර්ධනය කිරීම සඳහා යොමුකර පුහුණු හා සංවර්ධන වැඩසටහන් සංවිධානය ඇත.

මෙහිදී ආයතනයේ කටයුතු සාර්ථක කරගැනීම සඳහා විවිධ අයුරින් දායක වූ සීමිත කාර්යමණ්ඩලය විශේෂයෙන් සඳහන් කළ යුතුයි. විශ්‍රාමික හා දැනට සේවයේ නියුතු රජයේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන්, විශ්ව විද්‍යාල කථිකාචාර්යවරුන්, පෞද්ගලික අංශයේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් සහ විෂය විශේෂඥයින් දැක්වූ සහයෝගය ද ඉතාමත් වැදගත් වේ.

ජාතික ශ්‍රම අධ්‍යන ආයතනය ස්වකීය ඉලක්ක ගත ගමන් මග තුළ ඉදිරියට යාමට කම්කරු හා වෘත්තිය සමිති සබඳතා අමාත්‍යංශයේ ගරු අමාත්‍යතුමා හා ලේකම්තුමා ඇතුළු ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගෙන් ලැබුණු මගපෙන්වීම, මෙන්ම නිරන්තර දිරිගැන්වීම මහත් ශක්තියක් වූ බව මෙහිදී සඳහනි කළ යුතුය.

අවසාන වශයෙන් ආයතනය කෙරෙහි මෙන්ම ආයතනයේ පාඨමාලා පුහුණු හා සංවර්ධන වැඩසටහන් කෙරෙහි විශ්වාසය තබා සිය කාර්ය මණ්ඩලය පුහුණුව සඳහා යොමු කළ අමාත්‍යංශ, දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා සහ ව්‍යවස්ථාපිත ආයතන සහ පෞද්ගලික අංශයේ ආයතන ප්‍රධානියා දැක්වූ සහයෝගය කෘතඥතා පූර්වකව සඳහන් කරනු කැමැත්තෙමි.

සමන් ඩී. වඩුගේ
අධ්‍යක්ෂ ජනරාල්

# පටුන


| | පිටුව |
|---|---|
| 1.0 ආයතනයේ කටයුතු | 01-05 |
| 1.1 දැක්ම,මෙහෙවර සහ ආයතනයේ වටිනාකම් | |
| 1.2 ආයතනයේ අරමුණු | |
| 1.3 ආයතනයේ පරිපාලනය | |
| 1.4 සංවිධාන ව්‍යුහය | |
| 1.5 ආයතනයේ ප්‍රධාන ක්‍රියාකාරකම් | |
| 2.0 පුහුණු හා සංවර්ධන | 06-13 |
| 2.1 ඩිප්ලෝමා පාඨමාලා | |
| 2.2 සහතිකපත්‍ර පාඨමාලා | |
| 2.3 කෙටිකාලීන සහ සකස් කරගත් පාඨමාලා | |
| 2.4 ආයතනික පහසුකම් | |
| 2.5 සම්පත්දායකයින් | |
| 2.6 2015 වර්ෂයේ මෙහෙයුම් විමසුම | |
| 2.7 කම්කරු සහ කාර්මික සබඳතා | |
| 2.8 මානව සම්පත් කළමනාකරණය | |
| 2.9 කාර්යස්ථාන ඵලදායිතාවය | |
| 3.0 මුල්‍ය ප්‍රකාශන | 14-27 |
| 3.1 මුල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය | |
| 3.2 මුල්‍ය ක්‍රියාකාරිත්වය පිළිබඳ ප්‍රකාශනය | |
| 3.3 මුල්‍ය ප්‍රවාහ ප්‍රකාශනය | |
| 3.4 මුල්‍ය ප්‍රකාශන සටහන | |
| 4.0 විගණකාධිපති වාර්තාව | 28-36 |

# ජාතික ශ්‍රම අධ්‍යයනය ආයතනය (NILS)

**කම්කරු අංශයේ ත්‍රෛයිපාර්ශික කොටස්කරුවන් සඳහා විශිෂ්ඨ සේවාවක් ලබාදීම පිළිබඳව අපිට විශ්වාසනීයයි.**

**1.0** ආයතනය ගැන:- **ජාතික ශ්‍රම අධ්‍යයනය ආයතනය 2007 සැප්තැම්බර් 11 වැනි දින පිහිටවා ඇති 2010 අංක 12 දරන පනත මඟින් ශ්‍රී ලංකා ප්‍රජාත්‍රාන්තික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් ව්‍යවස්ථාපිත ආයතනයක් ලෙස සංස්ථාපනය කරන ලදී. ශ්‍රී ලංකාවේ ශ්‍රම අධ්‍යයනය ප්‍රවර්ධනය කිරීම සඳහා පර්යේෂණ පැවැත්වීම, සමීක්ෂණ සිදු කිරීම සහ පුහුණු සැපයීම් අරමුණින් මෙම ආයතනය පිහිටුවන ලදී.**

**දැනට, මෙම ආයතනය කම්කරු සහ කම්කරු සබඳතා අමාත්‍යංශය යටතේ වූ ව්‍යවස්ථාපිත ආයතනයක් ලෙස කටයුතු කරයි.**

<u>අපගේ ආදර්ශ පාඨය</u>

**ජීවිතේ සඳහා කුසලතාවයන් සහ සාරධර්ම**

**<u>1.1 දැක්ම</u>**

**ශ්‍රී ලංකාවේ සමාජ ආර්ථික සංවර්ධනය සඳහා කාර්මික සාමය සහ සංහිඳියාව**

<u>මෙහෙවර</u>

**අධ්‍යපන, පර්යේෂණ සහ පුහුණුව ඔස්සේ ඵලදායි කම්කරු සබඳතාවයන් පවත්වා ගැනීම සහ සංවර්ධනය කිරීම සඳහා ත්‍රෛයිපාර්ෂවීය කොටස්කරුවන් වෙත පහසුකම් සැලසීම**

ප්‍රධාන වටිනාකම්

- ප්‍රතිපාදන සේවාවන්
- පාරිභෝගික කේන්ද්‍රීය වීම
- සහයෝගයෙන් කටයුතු කිරීම
- වෙනසකට සූදානම් වීම

iv

## 1.2 අරමුණු

පනතේ ඇතුලත් පහත සඳහන් අරමුණු වෙත ළගාවීමට ආයතනය විසින් ඉලක්කගත කරනු ලබයි.

1. සංවර්ධන ක්‍රියාවලියේදී, සේවකයන් සක්‍රිය සහකරුවන් කරලීම සඳහා ඔවුන්ගේ සුබසාධනය තහවුරු කිරීමට පියවර ගැනීම සඳහා දේශීය සහ විදේශීය ආයතන සමඟ සහයෝගයෙන් සේවක අධ්‍යාපන වැඩසටහන ක්‍රියාත්මක කිරීම.
2. ශ්‍රම අධ්‍යයනය පිළිබඳව සම්මන්ත්‍රණ, වැඩමුළු, සමුළු සහ රැස්වීම් පැවැත්වීම සහ එයට අමතරව සඟරා, ජර්නල්, වාර සඟරා සහ පොත්පත් ප්‍රකාශනය කිරීම.
3. ශ්‍රම අධ්‍යයනයට සම්බන්ධ පර්යේෂණ සිදුකිරීම, සමීක්ෂණ පැවැත්වීම සහ අධ්‍යයන පාඨමාලාවක් සැපයීම.
4. පුස්තකාල සහ තොරතුරු සේවාවන් පිහිටුවීම සහ පවත්වාගෙන යැම.
5. සමාන අරමුණු සහිත දේශීය සහ විදේශීය යන දෙකෙහිම ආයතන, සංවිධාන සංගම් සහ සමාජ සමඟ වඩාත් සමීපයට කටයුතු කිරීම.
6. විශ්වවිද්‍යාල සහ සමාන ආයතනවල සහයෝගිතාවයෙන් ශ්‍රම අධ්‍යයන පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලා ඇතුළුව පාඨමාලා පැවැත්වීම සහ එලෙස අවශ්‍ය වූ විටක සහතික සහ ඩිප්ලෝමා ප්‍රදානය සිදුකිරීම.
7. කාර්මික සංහිඳියාව පවත්වා ගැනීමේදී, ඉලක්ක කිරීමේදී, ඉලක්ක කරගත් ක්‍රියාකාරකම් ප්‍රවර්ධනය සහ සම්බන්ධය.

## 1.3 ආයතනයේ පරිපාලනය :-

මෙම පනතේ විධිවිධාන පරිදි, පරිපාලනය, කළමණාකරණය සහ ආයතනයේ කටයුතු පාලනය කිරීම ආයතනයේ පාලක මණ්ඩලයක් විසින් සිදු කරනු ලබයි. මෙම මණ්ඩලය කම්කරු අංශයේ ත්‍රෛයිපාර්ෂික කොටස්කරුවන් නියෝජිතයන්ගෙන් සමන්විත වෙයි. එනම්, සේවායෝජකයින්, සේවකයින් (වෘත්තීය සමිති නියෝජනය කරමින්) සහ අදාල ක්ෂේත්‍රයේ විශේෂඥයන් ඇතුළුව රාජ්‍ය නිලධාරීන් පනත මගින් විෂයභාර අමාත්‍යවරයා පැවරී ඇති බලතල පරිදි කම්කරු විෂයභාර අමාත්‍යවරයා විසින් ආයතනයේ පාලන මණ්ඩලය පත්කරනු ලැබේ.

2015 වර්ෂයේදි ආයතනයේ පාලක මණ්ඩලය පහත පරිදි වේ.

1) හේරත් යාපා මහතා, ලේකම්, කම්කරු සහ වෘත්තීය සමිති සබඳතා අමාත්‍යාංශය - සභාපති -2015 අගෝස්තු දක්වා
2) ඒ.එම්.ගෝඨාභය ජයරත්න මහතා, ලේකම් කම්කරු සහ කම්කරු සබඳතා අමාත්‍යාංශය-ලේකම්-2015-සැප්තැම්බර් සිට
3) චාන්දනී අමරතුංග මිය-කම්කරු කොමසාරිස් ජනරාල් -උපසභාපති
4) සී.එච්.රණතුංග මිය-සාමාජික-2015 ජුනි සිට

5) මහාචාර්ය සුනිල් චන්ද්‍රසිරි-සාමාජික
6) ඒ.විමලවීර මහතා-වැඩබලන අධ්‍යක්ෂ ජනරාල් (NILS)
7) ඒ.ලෙස්ලි ඩෙවේන්ද්‍ර මහතා-සමාජික
8) රොහාන් ජී.පණ්ඩිත කෝරලගේ මහතා-සමාජික
9) ඩබ්ලිව්.එම්.කේ.එල්.වීරසිංහ මහතා-සාමාජික
10) ඩබ්ලිව්.එම්.චන්ද්‍රසිරි-සමාජික-2015 ජුනි සිට
11) ආර්.එල්.පී.පීරිස්-සාමාජික-2015 මාර්තු දක්වා
12) එස්.එච්.එම්.චිත්‍රානන්ද-සමාජික-205 මාර්තු දක්වා
13) සුරංග තාවුලගේ මහතා-සමාජික-205 ඔක්තෝම්බර් දක්වා
14) ජේ.එම්.එම්.පී.උපුල් ජයසිංහ මහතා-සමාජික-205 ඔක්තෝම්බර් දක්වා
15) එච්.එම්.අබේරත්න මහතා-සමාජික-2015 ඔක්තෝම්බර් දක්වා
16) ඇන්ටන් මාකෝස් මහතා--සමාජික-2015 ඔක්තෝම්බර් දක්වා
17) මාලින් ගුණතිලක මහතා--සමාජික-2015 ඔක්තෝම්බර් දක්වා
18) ආර්.එම්.පි.රත්නායක මහතා-සමාජික-2015 ඔක්තෝම්බර් දක්වා
19) දහම් ගුණවර්ධන මහතා-සමාජික-2015 ඔක්තෝම්බර් දක්වා
20) සමන්ති සේනානායක මිය-සමාජික-2015 ඔක්තෝම්බර් දක්වා
21) ඒ.එන්.ඉලන්ගමින් මිය-සමාජික-2015 ඔක්තෝම්බර් දක්වා
22) සී.බී.මයාදුන්නේ මහතා--සමාජික-2015 ඔක්තෝම්බර් දක්වා
23) ජේ.එම්.එන්.ජයසිංහ මහතා-සමාජික-2015 ඔක්තෝම්බර් දක්වා
24) එම්.ඒ.එම්.ජී.මොරගොල්ල මහතා-සමාජික-2015 ඔක්තෝම්බර් දක්වා
25) ඩබ්ලිව්.එන්.එස්.වික්‍රමසිංහ මහතා-සමාජික-2015 ඔක්තෝම්බර් දක්වා
26) ධර්ම ශ්‍රී වීරසිංහ -සමාජික-2015 ඔක්තෝම්බර් දක්වා
27) පී.එස්.අරඹවත්තේ මිය--සමාජික-2015 ඔක්තෝම්බර් දක්වා
28) ආර්.බී.ගන්කේවල මිය-සමාජික-2015 ඔක්තෝම්බර් දක්වා

## 1.4 සංවිධාන ව්‍යුහය

අධ්‍යක්ෂ ජනරාල්වරයා ආයතනයේ ප්‍රධාන විධායක නිලධාරියා වන අතර පනතේ විධිවිධාන පරිදි ඔහු පත්කරනු ලැබේ. පාලක මණ්ඩලය විසින් කලින් කලට පවරා දෙනු ලබන බලතල, කාර්යන් සහ රාජකාරි ක්‍රියාත්මක කිරීම සඳහා අධ්‍යක්ෂ ජනරාල්වරයා වගකිව යුතුය.

ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය එකිනෙකට වෙනස් අංශ ත්‍රිත්වයක් යටතේ ක්‍රියාත්මක වෙයි. එනම්;

- පුහුණු සහ සංවර්ධන
- පර්යේෂණ , සැලසුම් සහ ප්‍රකාශන
- පරිපාලන සහ මුදල්

පුහුණු සංවර්ධන අංශය යටතේ අංශ ත්‍රිත්වයක් පවතියි

කම්කරු නීති සහ කාර්මික සබඳතා; මානව සම්පත් කළමනාකරණය සහ වැඩපොළ ඵලදායිතාව වැඩිදියුණු කිරීම. දැනට මෙම අංශවල කාර්යයන් ඉටුකිරීම පිළිබඳ නිලධාරීන් දෙදෙනෙකු වගකියනු ලැබේ.

සියලුම සැලසුම් පාලනය කිරීම, ආයතනයේ සියළුම ක්‍රියාකාරකම්වල ප්‍රගතිය ඇගයීම සහ නිරීක්ෂණය සහ වරින් වර වාර්තා සකස්කිරීම. පිළිබඳව පර්යේෂණ, සැලසුම් සහ ප්‍රකාශන අංශය වග කියනු ලැබේ.ආයතනයේ ගණකාධිකාරිවරයා විසින් අංශ ප්‍රධානියාගේ රාජකාරි ආවරණය කරනු ලබයි. පරිපාලන සහ මූල්‍ය අංශය මඟින් සේවකයන් පස් දෙනෙකුගෙන් සමස්ත ආයතනයේ සියළුම පරිපාලන සහ මූල්‍ය කාරණාවන් ඉටු කිරීම සඳහා පහසුකම් සලසයි.

## 1.5 ආයතනයේ ප්‍රධාන ක්‍රියාකාරකම්:-

සිය වෘත්තීන් වැඩි දියුණු කිරීමේදී ශ්‍රී ලංකා ශ්‍රම බලකායට සහයෝගය දැක්වීම සඳහා ගුණාත්මක බවින් යුත් පුහුණු සහ සංවර්ධන වැඩසටහන් සැපයීම මගින් සහභාගිවන්නන්ගේ දැනුම, කුසලතා, සහ ආකල්ප පළල්කිරීම සඳහා ආයතනය බැදී සිටියි. ජාතික ශ්‍රම අධ්‍යයන ආයතන පනතේ අන්තර්ගත විධිවිධාන ප්‍රකාරව, ප්‍රධාන විෂය පථයන් ත්‍රිත්වයක ක්‍රියාකාරකම් ආයතනය විසින් ඉටුකරනු ලබයි.

1. කම්කරු නීතිය සහ කාර්මික සබඳතා
2. මානව සම්පත් කළමනාකරණය
3. වැඩපොළ ඵලදායිතාවය සහ වැඩිදියුණු කිරීම.

සමාජ සංවාද ප්‍රවර්ධනය සහ සමාජ ආරක්ෂණ වැඩසටහන්හී ආවරණය පළල්කිරීම ඔස්සේ සේව්‍ය සේවක අයිතීන් ආරක්ෂා කිරීම සහ ත්‍රෛයිපාර්ශික කොටස්කරුවන් සවිබලගැන්වීම සඳහා ඉලක්කගත කරන ලද පුහුණු සහ සංවර්ධන වැඩසටහන් ඉටුකිරීම සහ මූල පිරවීම සඳහා කම්කරු නීති සහ කාර්මික සබඳතා අංශය වගකියනු ලැබේ.

මිනිස් කළමනාකරණයේ වඩාත් හොඳ ක්‍රියාකාරකම් භාවිතා කිරීම සඳහා සිය හැකියාව වර්ධනය කරගැනීම මඟින් නිෂ්පාදන හෝ සේවාවන් ලබාදීමේ ක්‍රියාවලියේදී කාර්යක්ෂමතාවය වැඩිදියුණු කරලීම සඳහා යටත් නිළධාරීන්ගේ කැමැත්තක් ඇතිකරලීම මගින් වෙළඳපල පරිසරය වෙනස් කිරීම සඳහා සංවිධානයන්හි මිනිසුන් කළමණාකරණය කිරීමේ ක්‍රියාකාරකම් සහ විනය වැඩිදියුණු කිරීම සඳහා පාඨමාලා පැවැත්වීම මානව සම්පත් කළමණාකරණ අංශයේ අරමුණයි.

වඩාත් හොඳ ඵලදායී වැඩපළක් ඇතිකරලීම සඳහා සේවක කාර්යය සාධනය වැඩිදියුණු කිරීම සඳහා පුහුණු සහ සංවර්ධන පාඨමාලා පැවැත්වීම, ප්‍රශ්න වලක්වා ගැනීම සඳහා පූර්ව ක්‍රියාකාරී ප්‍රවේශයක් ගැනීම සඳහා සහ පරිසරය උදෙසා ප්‍රවේශයක් ක්‍රමානුකූලව වෙනස් කිරීම, වැඩපොළ ඵලදායිතාවය සහ වැඩිදියුණු කිරීමේ අංශයේ අරමුණයි.




විසඳුම් සෙවීම සහ ප්‍රතිපත්ති නිර්දේශ ඇති කිරීම සඳහා කම්කරු අංශය තුළ පවතින සහ ඉස්මතු වන ගැටළු සහ ප්‍රශ්න විමර්ශනය සහ විශලේෂණය සඳහා ආයතනය විසින් පර්යේෂණසහ සමීක්ෂණ පැවැත්වීමේ යෙදී සිටියි. මීට අමතරව, ජාතික ශ්‍රම අධ්‍යයන ආයතන මඟින් රාජ්‍ය, අර්ධ රාජ්‍ය සහ පුද්ගලික අංශයේ ආයතනවල සේවකයන් බඳවාගැනීම සහ ප්‍රවර්ධනය කිරීම සඳහා වෘත්තීයමය ආකාරයේ විභාග පවත්වනු ලැබේ.

පර්යේෂණාත්මක හෙළිදරව් කිරීම් සහ අත්දැකීම් පදනම් කරගෙන ජර්නල්, වාර සඟරා, සහ ග්‍රන්ථ පළකිරීම ත්‍රෛයිපාර්ශික කොටස්කාර සාමාජිකයන්ට අධ්‍යාපනය ලබාදීමට සම්බන්ධවීම ආයතනයේ තවත් වැදගත් අංශයකි.

තවද, කම්කරු සහ වෘත්තීය සමිති සබඳතා අමාත්‍යාංශය, කම්කරු දෙපාර්තමේන්තුව, අනෙකුත් රාජ්‍ය ආයතන, අර්ධ රාජ්‍ය ආයතන, පුද්ගලික සහ රාජ්‍ය නොවන සංවිධාන සමඟ සහයෝගයෙන් මෙම ආයතනය ක්‍රියාත්මක වෙයි. මීට අමතරව, අන්තර් ජාතික කම්කරු සංවිධානය, කොරියානු අන්තර් ජාතික සහයෝගිතා කාර්යාලය සහ එක්සත් ජාතීන්ගේ සංවිධානය වැනි අන්තර්ජාතික සංවිධාන බලඇණි සමඟ ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය සම්බන්ධවෙයි. ඒ හා සමාන ඉන්දියානු සංවිධානයක් වන ඉන්දියාවේ වී.වී.ගිරි ජාතික ශ්‍රම ආයතනය සමඟ අනන්‍යෝන්‍ය සහයෝගය සඳහා අවබෝධතා ගිවිසුමක් අත්සන් කර ඇති අතර රුසියානු ශ්‍රම ආයතනය සමඟ සාකච්ඡාවක් ආරම්භකර ඇත.




## 2.0 පුහුණු සහ සංවර්ධන

ඩිප්ලෝමා සහ සහතික පත්‍ර පාඨමාලා, කෙටිකාලීන පාඨමාලා, වැඩමුළු සහ සම්මන්ත්‍රණ ආදිය ඔස්සේ පළල් සේවා පරාසයක් ආයතනය විසින් ලබාදෙයි. මීට අමතරව සිය සේවක නිපුණතාවන් වැඩිදියුණුකරලීම සඳහා සේවාදායක සංවිධාන විසින් කරන ලද විශේෂ ඉල්ලීම් මත සකස්කරන ලද වැඩසටහන් පවත්වනු ලබයි. කළමණාකරන සංවර්ධන වැඩසටහන් මාර්ගයෙන් පාසල් හැරගිය වූවන්ගේ සිට ඉහළ වෘත්තීන් දක්වා වූ පරාසයක සමාජයේ විශාල පිරිසකට ආයතනය විසින් සේවාවන් ලබාදෙයි. පුද්ගලික අංශය, වෘත්තීය සමිති නායකයින්, රාජ්‍ය නිලධාරීන් සහ එලෙස වීම සඳහා සේව්‍යයන් හා සේවකයන්ගේ ධාරිතාව වැඩිදියුණු කිරීමට අධ්‍යාපන හා පුහුණු අවස්ථාවන් ලබාගත හැකිය.





## 2.1 ඩිප්ලෝමා පාඨමාලාවන්

එහි මූලික අධ්‍යාපනික ක්‍රියාකාරකම ලෙස ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය මඟින්,

1. කම්කරු නීතිය සහ කාර්මික සබඳතා
2. මානව සම්පත් කලමනාකරණය
3. වැඩපොළ ඵලදායිතාවය ආශ්‍රිතව ඉතාමත් ඉහළ ශාස්ත්‍රීය හා වෘත්තීය මට්ටමේ ඩිප්ලෝමා පාඨමාලා ත්‍රිත්වයක් පවත්වනු ලැබේ.

## 2.2 සහතික පාඨමාලාවන්

වාර්ෂිකව ආයතන මගින් විෂයයන් ත්‍රිත්වයකින් සහතික පත්‍ර පාඨමාලා 24 ක් පවත්වනු ලැබේ. එනම් කම්කරු නීතිය සහ කාර්මික සබඳතා, මානව සම්පත් කළමනාකරණය සහ ඩිප්ලෝමා පාඨමලාවන්හී අධ්‍යයන ඒකකයන්ට සහභාගිවීම, වැඩපොළ ඵලදායිතාවය ඉහළ නැංවීම.

## 2.3 කෙටිකාලීන සහ සකස් කරගත් පාඨමාලාවන්

ප්‍රධාන විෂය කලාපයන් තුල ආයතනය විසින් දින 1 සිට දින 03 දක්වා වූ කෙටිකාලීන පුහුණු පාඨමාලාවන් පවත්වනු ලබයි. තවද ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනයේ පුහුණු මධ්‍යස්ථාන වලදී හෝ ඉල්ලීම් කරන සංවිධාන වලදී සේවා දායක ආයතනවල ඉල්ලීම මත ආයතනය විසින් සකස්කරගත් පුහුණු පාඨමාලාවන් පවත්වනු ලැබේ.





## 2.4 පහසුකම්

සියලුම නූතන පුහුණු පහසුකම් සහිත සම්පූර්ණයෙන්ම වායු සමනය කරන ලද ශ්‍රවණාගාර සහ දේශන ශාලාවලින් ආයතනය සමන්විතය.





## 2.5 සම්පත් පුද්ගලයින්

රට තුල ලබාගත හැකි අදාළ විෂය පථයන් වල ඉහළ සුදුසුකම්ලත්,වඩාත් හොඳ පලපුරුදු සම්පත් පුද්ගලයන් මණ්ඩලයක් හිමිකරගැනීමට ආයතනය  වරප්‍රසාද ලබයි. සම්පත් මණ්ඩලය සඳහා විශ්ව විද්‍යාල සහ වෙනත් ජාතික අධ්‍යාපන ආයතනවල වර්තමාන සහ කලින් සිටි විද්වතුන් ,ප්‍රතිපත්ති සැලසුම්කරුවන්, අමාත්‍යාංශ ලේකම්වරුන්, ජේෂ්ඨ කළමනාකරුවන්, අර්ධ රාජ්‍ය ආයතනවල ක්‍රියාකාරකයින් ඇතුළු රාජ්‍ය ආයතනවල ජේෂ්ඨ නිලධාරින් සහ කර්මාන්ත විශේෂඥයින් ඇතුළු වෙයි.

## 2.6 2015 වර්ෂයේ මෙහෙයුම් විමසුම

ක්‍රියාකාරි සැලැස්මට අනුව ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය මගින් එක් දින වැඩසටහන් 26 ක්, දෙදින වැඩසටහන් 18 ක් සහ තෙදින වැඩසටහන් 6 ක් පැවැත්වීමට සැලසුම් කරන ලදී. එක් දින වැඩසටහන් 29 ක්, දෙදින වැඩසටහන් 20ක්, තෙදින වැඩසටහන් 9 ක් පැවැත්වීම මගින් ඉලක්කගත ප්‍රමාණයට වඩා වැඩියෙන් සිදුකිරීමට ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනයට හැකි විය.එමගින් සේවාදායකයින් විසින් සිදුකරන ලද ඉල්ලීම පරිදි සකස්කරගන්නා ලද විශේෂ වැඩසටහන් 4 ක්ද පවත්වා ඇති රාජ්‍ය සංවිධාන සඳහා විභාග 3ක් පවත්වන ලදී. කෙසේවෙතත්, ආයතනය මඟින් ඩිප්ලෝමා පාඨමාලා 3ක් පැවැත්වීමට ඉලක්ක කළත්, ඩිප්ලෝමා පාඨමාලා 2ක් පමණක් පැවැත්වීමෙන් එය ප්‍රගතියක් දක්වන ලදී.

**2015 වසරේදී කෙටිකාලීන පාඨමාලා 50ක් සහ ඩිප්ලෝමා පාඨමාලා 3ක් ඔස්සේ ආයතනයේ මූල්‍ය ඉලක්කය රුපියල් මිලියන 5.6ක් විය. අවසාන වශයෙන්, ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය මගින් සකස්කරගත් පාඨමාලා 4ක් සහ විභාග 3 ක් ඇතුළුව කෙටිකාලීන පාඨමාලා 62ක් පැවැත්වීමෙන් රුපියල් මිලියන 11.2ක මුදලක් උපයාගන්නා ලදී. ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනයේ ඉපයීම් වර්ෂයේ ඉලක්කයට සාපේක්ෂව 100%කින් වර්ධනය වී ඇත.**







**2015 වර්ෂයේ භෞතික සහ මූල්‍ය කාර්යය සාධනය ප්‍රධාන විෂයන් පිළබඳ ආයතන ප්‍රගතිය පහත දැක්වේ.**

වගුව: 1

| වැඩසටහන් | භෞතික | | මූල්‍ය | |
|---|---|---|---|---|
| | ඉලක්කය | ප්‍රගතිය | ඉලක්කය (රු.'000) | ප්‍රගතිය (රු.'000) |
| එක් දින | 26 | 29 | 864 | 1,168 |
| දෙදින | 18 | 20 | 924 | 2,102 |
| තෙදින | 6 | 9 | 1,020 | 2,060 |
| විශේෂ සහතික පාඨමාලා | 0 | 4 | 0 | 2,552 |
| පවත්වන ලද විභාග | 0 | 3 | 0 | 288 |
| ඩිප්ලෝමා පාඨමාලා | 3 | 2 | 2,772 | 2,992 |
| **මුළු ගනන** | **53** | **67** | **5.580** | **11,162** |





ප්‍රධාන විෂය පථයන් පිළිබඳව ආයතනයේ ප්‍රගතිය පහත දක්වනු ලැබේ.


## 2.7 කම්කරු නීති සහ කාර්මික සබඳතා

**කෙටිකාලීන පුහුණු වැඩසටහන් 15 ක් සහ ඩිප්ලෝමා වැඩසටහන් 1ක් ඔස්සේ කම්කරු නීති සහ කාර්මික සබඳතා අංශයේ මූල්‍ය ඉලක්කය රුපියල් මිලියන 1.8 ක් විය. කෙසේවෙතත් මෙම පුහුණු වැඩසටහන් අංශය සඳහා වූ ඉහළ සහභාගීත්වය නිසා කෙටිකාලීන වැඩසටහන් 13 ක් සහ ඩිප්ලෝමා වැඩසටහන් 1ක් පැවැත්වීමෙන් රුපියල් මිලියන 5.2ක් උපයන ලදී.**

වගුව: 2

| වැඩසටහන් | භෞතික | | මූල්‍ය | |
|---|---|---|---|---|
| | ඉලක්කය | ඉලක්කය | ඉලක්කය (රු.'000) | ප්‍රගතිය (රු.'000) |
| එක් දින | 8 | 4 | 288,000.00 | 270,000.00 |
| දෙදින | 4 | 4 | 288,000.00 | 666,000.00 |
| තෙදින | 3 | 2 | 288,000.00 | 232,000.00 |
| විශේෂ සහතික පාඨමාලා | - | 3 | - | 2,408,400.00 |
| පවත්වන ලද විභාග | 1 | 1 | 924,000.00 | 1,651,500.00 |








## 2.8 මානව සම්පත් කළමනාකරණය

වර්ෂය සඳහා මානව සම්පත් කළමනාකරණ අංශයේ මූල්‍ය ප්‍රගතිය රුපියල් මිලියන **1.8**ක් විය. කෙටිකාලීන වැඩසටහන් **17**ක් සහ ඩිප්ලෝමා වැඩසටහන් **1** ක් පැවැත්වීමට සැලසුම් කරන ලදී. කෙසේවෙතත් දරන ලද අධික පරිශ්‍රමය හේතුවෙන් එක් ඩිප්ලෝමා පාඨමාලාවක් හා කෙටිකාලින වැඩසටහන් **24** ක් පැවැත්විමට හැකි වූ අතර ඉලක්කගත ආදායමට වඩා **89%** කින් ඉහළ වූ රුපියල් මිලියන **3.4** ක් උපයන ලදී.

වගුව 03

| වැඩසටහන් | භෞතික | | මූල්‍ය(රු.000) | |
|---|---|---|---|---|
| | ඉලක්කය | ප්‍රගතිය | ඉලක්කය | ප්‍රගතිය |
| එක් දින | 9 | 14 | 324 | 695 |
| දෙදින | 7 | 6 | 504 | 614 |
| තෙදින | 1 | 4 | 96 | 792 |
| ඩිප්ලෝමා | 1 | 1 | 924 | 1,339 |









## <u>2.9 වැඩපොල ඵලදායිතාවය ඉහලයෑම</u>

කෙටිකාලීන වැඩසටහන් 18 ක් සහ ඩිප්ලෝමා පාඨමාලා 1ක් පැවැත්වීමෙන් වැඩපොළ ඵලදායිතාවය ඉහළ නැංවීමේ අංශයේ මූල්‍ය ඉලක්කය රුපියල් මිලියන 1.9කි. අර්ධකාලීන වශයෙන්, කෙටිකාලීන වැඩසටහන් 25 ක් පැවැත්වීමෙන් මෙම අංශය විසින් රුපියල් මිලියන 2.2 ක් උපයන ලදී. නමුත් මෙම ඩිප්ලෝමාව සඳහා ප්‍රමාණාත්මක නොවන සහභාගීත්වයක් නිසා කළමණාකාරීත්වය විසින් අදාල වැඩසටහන කල්දැමීමට තීන්දුකරන ලදී.

| වැඩසටහන් | භෞතික | | මූල්‍ය(රු.000) | |
|---|---|---|---|---|
| | ඉලක්කය | ප්‍රගතිය | ඉලක්කය | ප්‍රගතිය |
| එක් දින | 11 | 9 | 324 | 688 |
| දෙදින | 10 | 7 | 504 | 1,006 |
| තෙදින | 2 | 3 | 192 | 365 |
| විශේෂ පාඨමාලා | 0 | 1 | 0 | 144 |
| ඩිප්ලෝමා | 1 | 0 | 924 | 0 |



## 3.0 මූල්‍ය ප්‍රකාශන

### 3.1 2015 දෙසැම්බර් 31 වැනි දිනට මූල්‍ය තත්වය පිළිබඳව ප්‍රකාශනය

**NATIONAL INSTITUTE OF LABOUR STUDIES**
**STATEMENT OF FINANCIAL POSITION**
**AS AT 31 DECEMBER 2015**

| | Note | 2015 | 2014 |
|---|---|---|---|
| | | Rs. | Rs. |
| **Assets** | | | |
| **Non Current Assets** | | | |
| Plant and Equipment | 14 | 10,527,368.32 | 10,263,872.75 |
| **Current Assets** | | | |
| Inventories | 15 | 163,465.37 | |
| Receivables | 16 | 4,045,760.95 | 5,743,454.62 |
| Ministry Account | 17 | 89,500.00 | 89,500.00 |
| Received in advance | 18 | (9,000.00) | |
| Cash & Cash Equivalent | 19 | 25,450,748.94 | 17,445,579.67 |
| **Total Assets** | | **40,267,843.58** | **33,542,407.04** |
| **Liabilities** | | | |
| **Current Liabilities** | | | |
| Accrued Expenses | 20 | 218,559.14 | 291,226.63 |
| **Total Net Assets** | | **40,049,284.44** | **33,251,180.41** |
| **Net Assets/ Equity** | | | |
| Accumulated Fund | | | |
| Balance B/F as at 01.01.2015 | | 33,251,180.41 | 26,916,725.72 |
| Adjustments in respect of the previous years | 21 | (83,390.01) | (3,999.99) |
| Adjusted Balance as at 01.01.2015 | | 33,167,790.40 | 26,912,725.73 |
| Capital Reimbursment | 22 | 1,696,391.10 | 1,847,799.20 |
| Adjustment for the Period | 23 | 3,951,444.56 | |
| Excess/(Deficit) for the Year | | 1,233,658.38 | 4,491,641.59 |
| Revaluation Surplus / (Deficit) | 24 | | (986.11) |
| | | **40,049,284.44** | **33,251,180.41** |

The accounting policies on pages 07 to 09 and notes on pages 10 to 29 from an integral part of this financial statement. The Board of Directors are responsible for the prepration and presentation of these Financial Statements in accordance with the Sri lanka Public Sector Acounting Standards (SLPSAs). These Financial Statements were approved by the Board of Directors and signed on their behalf.

Lankika Weerasinghe
Accountant

Lankika Weerasinghe
Accountant
National Institute of Labour Studies
No. 267, Pannipitiya Road,
Pelawatta, Battaramulla

Saman D. Waduge
Director General

Saman D. Waduge
Director General
National Institute of Labour Studies
267, Pannipitiya Road,
Pelawatta, Battaramulla

S.M. Gotabaya Jayaratne
Chairman

S.M. Gotabaya Jayarathne
Secretary
Ministry of Labour and Trade Union Relat
2nd Floor, Labour Secretariat,
Colombo 05.

## 3.2 2015 දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වන වර්ෂය සඳහා වු මූල්‍ය ක්‍රියාකාරිත්වය පිළිබඳව ප්‍රකාශනය

| | සටහන 02 | 2015 | 2014 |
|---|---|---|---|
| | | රු. | රු. |
| **මෙහෙයුම් ආදායම** | | | |
| පුනරාවර්තන ප්‍රතිපූර්ණ කිරීම | 4 | 11,555,041.38 | 9,248,657.78 |
| ආදායම | 5 | 11,161,090.00 | 12,458,085.00 |
| **මුළු ආදායම** | | **22,716,131.38** | **21,706,742.78** |
| **මෙහෙයුම් වියදම්** | | | |
| පිරිස් වේතන | 6 | 7,412,495.76 | 1,702,200.11 |
| ප්‍රවාහන | 7 | 54,940.07 | 389,185.07 |
| භාවිතකරන ලද සැපයුම් සහ පාරිභෝගික භාණ්ඩ | 8 | 443,674.15 | 1,296,110.89 |
| නඩත්තු කිරීම් | 9 | 1,049,525.33 | 853,711.31 |
| ගිවිසුම්ගත සේවාවන් | 10 | 7,338,750.62 | 7,319,335.79 |
| ක්ෂය කිරීම්/ක්‍රමක්ෂය | 11 | 1,493,258.47 | 1,330,342.87 |
| අනෙකුත් මෙහෙයුම් වියදම් | 12 | 495,264.20 | 331,388.60 |
| වැඩසටහන් ක්‍රියාකාරකම් | 13 | 3,194,564.40 | 3,992,826.56 |
| **මුළු මෙහෙයුම් වියදම්** | | **21,482,473.00** | **17,215,101.20** |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් අතිරික්ත/හිඟ** | | **1,233,658.38** | **4,491,641.58** |
| **මූල්‍ය පිරිවැය** | | | |
| බැංකු ගාස්තු | | **-** | **-** |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් දළ අතිරික්ත/හිඟ** | | **1,233,658.38** | **4,491,641.58** |

### 3.3 2015 දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වන වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශනය

| | සටහන | 2015 | 2014 |
|---|---|---|---|
| <u>**මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් මුදල් ප්‍රවාහය**</u> | | රු. | රු. |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් අතිරික්ත/හිඟ | | 1,233,658.38 | 4,491,641.59 |
| **ගැළපීම්;** | | | |
| වැටුප්; අමාත්‍යංශය සහ දෙපාර්තමේන්තු | 23 | 3,951,444.56 | - |
| ක්ෂය ගනනය කිරීම | 11 | 1,493,258.47 | 1,330,342.86 |
| **සක්‍රීය ප්‍රාග්ධන ගාස්තුවලට පෙර මෙහෙයුම් ප්‍රතිලාභ** | | **6,678,361.41** | **5,821,984.45** |
| ඉන්වෙන්ටරිය තුල වැඩිවීම/අඩුවීම | 15 | (163,465.37) | - |
| ලැබීම් තුල වැඩිවීම/අඩුවීම | 16 | 1,697,693.67 | 3,799,057.15 |
| පෙර ගෙවීම් තුල වැඩිවීම/අඩුවීම | | - | 1,750,000.00 |
| උපචිත තුල වැඩිවීම/අඩුවීම | 20 | (72,667.49) | (1,185,295.57) |
| අත්තිකාරම් හි ලැබුණ ආදායම වැඩිවීම/අඩුවීම | 18 | 9,000.00 | |
| **මෙහෙයුම්වලින් උත්පාදනය වූ මුදල්** | | **8,148,922.22** | **10,185,746.03** |
| මූල්‍ය පිරිවැය | | - | - |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් දළ මුදල් ප්‍රවාහ** | | **8,148,922.22** | **10,185,746.03** |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් මුදල් ප්‍රවාහ** | | | |
| පිරියත සහ උපකරණ අත්පත්කර ගැනීම | 14.1 | (1,840,144.06) | (3,584,449.20) |
| ප්‍රාග්ධන ප්‍රතිපූර්ණය | 22 | 1,696,391.10 | 1,847,799.20 |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් දළ මුදල් ප්‍රවාහ** | | **(143,752.96)** | **(1,736,650.00)** |
| මුදල් සහ ඊට සමාන දේවල් හි වැඩිවීම/අඩුවීම | | 8,005,169.27 | 8,449,096.03 |
| වර්ෂය අරම්භයේදී මුදල් සහ ඊට සම දේවල් | 19 | 17,445,579.67 | 8,996,483.64 |
| **වර්ෂය අවසානයේදී මුදල් සහ ඊට සම දේවල්** | 19 | **25,450,748.94** | **17,445,579.67** |

**ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය**

2015 දෙසැම්බර් 31 වැනි දිනට

**කොටස්වල වෙනස්වීම් ප්‍රකාශනය**

| | 2015 |
|---|---|
| | **Rs.** |
| 2015/01/01 දිනට ඉ/ගෙ මුළු අරමුදල් ශේෂය | **33,251,180.41** |
| පසුගිය වර්ෂ සම්බන්ධයෙන් ගැලපීම් | (83,390.01) |
| 2015/01/01 දිනට ගලපන ලද ශේෂය | **33,167,790.40** |
| ප්‍රාග්ධන ප්‍රතිපූර්ණ කිරීම | 1,696,391.10 |
| කාලසීමාව සදහා ගැලපීම | 3,951,444.56 |
| වර්ෂය සදහා අතිරික්ත/හිඟ | 1,233,658.38 |
| 2015/12/31 දිනට ශේෂය | **40,049,284.44** |

## 3.4 ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය.

## අංක 267,පන්නිපිටිය පාර,පැලවත්ත,බත්තරමුල්ල

## මූල්‍ය ප්‍රකාශන සටහන

2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන

**1.ආයතන තොරතුරු**

**1.1 සාමාන්‍ය**

**ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය කම්කරු සහ වෘත්තීය සමිති සබඳතා අමාත්‍යාංශය යටතේ ඇති ව්‍යවස්ථාපිත ආයතනයකි. කම්කරු දෙපාර්තමේන්තුවේ සේවක අර්ථ සාධක අංශය ප්‍රතිව්‍යුහගත කරමින් කම්කරු විෂය භාර අමාත්‍යාංශය යටතේ 2007 වර්ෂයේ සප්තැම්බර් හිදී මෙම ආයතනය පිහිටුවන ලදී. පාර්ලිමේන්තුව විසින් 2012 අංක 12 දරන පහත ක්‍රියාත්මක කිරීම මගින් එය නීතියානුකූලව පිහිටුවන ලදී. පහත පරිදි සේවා යෝජකයින්. වෘත්තීය සමිති සහ රාජය නිලධාරින් නියෝජනය කරමින් සේවකයින් ඇතුළු කම්කරු ක්ෂේත්‍රයේ ත්‍රෛපාර්ශික කොටස්කරුවන්ගේ නියෝජිතයන්ගෙන් සමන්විත පාලන මණ්ඩලයක් විසින් ආයතනය පාලනය කරනු ලැබේ. මෙම ආයතනය අංක 267, පන්නිපිටිය පාර,පැලවත්ත, බත්තරමුල්ල ලිපිනයේ පිහිටා ඇත.**

**1.2 <u>මූලික ක්‍රියාකාරකම් සහ මෙහෙයුම් ස්වභාවය</u>**

**ආයතනයේ මූලික ක්‍රියාකාරකම් වනුයේ පුහුණු වැඩසටහන්, කම්කරු නීතිය සහ කාර්මික සබඳතා, වැඩ පොළ ඵලදායිතාවය ඉහළනැංවීම සහ මානව සම්පත් කළමනාකරණය පිළිබඳ වැඩමුළු පැවැත්වීම සහ පර්යේෂණ සහ ප්‍රකාශන පැවැත්වීම.**

**1.<u>3 ආයතන කාර්යය මණ්ඩලය</u>**

**2007 සැප්තැම්බර් සිට ආයතනය විසින් එහි මෙහෙයුම් ආරම්භ කළද, ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනයේ සේවක සංඛ්‍යාව අනුමත කිරීම 2014 මාර්තු වලදී ලබාගෙන ඇත. එවැනි තත්වයක් යටතේ, කම්කරු සහ වෘත්තීය සමිති සබඳතා අමාත්‍යාංශය සහ කම්කරු දෙපාර්තමේන්තුව විසින් ආයතන වෙත මෙහෙයුම් කාර්ය මණ්ඩලයක් ලබා දී ඇති අතර එම නිලධාරීන්ගේ වැටුප් අදාළ සංවිධාන විසින් ගෙවා ඇත. එම නිසා මෙම මූල්‍ය ප්‍රකාශයේ සඳහන් සේවක පිරිස් වේතන සහ වැටුප් දීමනා ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය මෙන්ම කම්කරු සහ කම්කරු සබඳතා අමාත්‍යාංශය සහ කම්කරු දෙපාර්තමේන්තුව විසින් ගෙවනු ලැබේ.**

**1.4** <u>ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනයේ මූල්‍ය කළමනාකරණය</u>

ආයතනයේ මූලාරම්භයේ සිට **2011** සැප්තැම්බර් **30** වන දින දක්වා ආයතනයේ මූල්‍ය කළමනාකරණය කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යාංශයේ විසින් සිදුකර ඇත.(කාර්ය මණ්ඩලය සහ වෙනත් බාධක හේතුවෙන්)

## 2.සුදානම් කිරීමේ පදනම

### 2.1 අනුකූලතා ප්‍රකාශනය

ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනයේ මූල්‍ය ප්‍රකාශනයන් මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශනය,මූල්‍ය ක්‍රියාකාරීත්වය පිළිබඳ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, කොටස්වල වෙනස්වීම් ප්‍රකාශය සහ මූල්‍ය ප්‍රකාශය සඳහා වූ සටහන් වලින් සමන්විත වෙයි. ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරිවරුන්ගේ ආයතනය විසින් නියම කරන ලද ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගණකාධිකරණ ප්‍රමිතීන්ට අනුව මෙම ප්‍රකාශයන් පිළියෙළ කරන ලදී.

### 2.2 මිණුම් පදනම

මූල්‍ය ප්‍රකාශනයක් උපචිත පදනම මත පිළියෙළ කර ඇති අතර, මූල්‍ය ප්‍රකාශනයන්ගේ උද්ධමනීය කාරණාවන් සඳහා ගැලපීම් සිදුකර නැත.

<u>පවතින ව්‍යාපාර</u>

පවතින ව්‍යාපාරයක් ලෙස පවත්වා ගැනීමට ඇති හැකියාව ස්ථාපිත කිරීමේ තක්සේරුවක් අධ්‍යක්ෂවරුන් විසින් සිදුකර ඇති අතර ඔවුන් විසින් ඇවර කිරිමට හෝ වෙළඳ කටයුතු අවසන් කිරිමට අදහස් නොකරයි.

### 2.4 සංසන්දනාත්මක තොරතුරු

ආයතනය විසින් ගිණුම්කරණ ප්‍රතිපත්තීන් නිරන්තරව යොදවා ඇති අතර, එම නිසා පසුගිය වර්ෂයේ භාවිතා කළ ඒවා සමඟ ඒවා අනුකූල නොවෙයි. වර්තමාන වර්ෂයේ ඉදිරිපත් කිරීම තහවුරු කිරීම සඳහා අවශ්‍ය අවස්ථාවකදී පසුගිය වර්ෂයේ දත්ත තොරතුරු සහ ප්‍රකාශනයන් නැවත සකස්කර ඇත.

### 2.5 ක්‍රියාකාරි සහ ඉදිරිපත් කිරීමේ මුදල් ඒකකය.

ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනයේ ක්‍රියාකාරි මුදල් ඒකකය වන ශ්‍රී ලංකා රුපියල් වලින් මෙම මූල්‍ය ප්‍රකාශය ඉදිරිපත් කරනු ලැබේ.

## 3.<u>වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිය</u>

පහත දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති මෙම මූල්‍ය ප්‍රකාශවල ඉදිරිපත් කර ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති මෙම මූල්‍ය ප්‍රකාශවල ඉදිරිපත් කර ඇති සියළුම කාල සීමාවන් සඳහා නිරන්තරව යොදවා ඇත.

### 3.1 <u>දේපළ , පිරියත, සහ උපකරණ</u>

දේපළ, පිරියත සහ උපකරණ පිරිවැය යනු වත්කම් එහි අපේක්ෂිත භාවිතය සඳහා එහි වැඩකරන තත්වයට ගෙන ඒමේදී සිදු වූ යම් යම් වියදම් සමඟ එන අත්පත් කරගැනීමේ හෝ ඉදිකිරීමේ පිරිවැයයි. පිරිවැයේදී වත්කමක් ලෙස මූලික හඳුනාගැනීමෙන් අනතුරුව, නැවත අගය කරන ලද වත්කම් එයින් ඇතිවන කිසියම් ක්ෂය වීමක් අඩුකිරීමෙන් අනතුරුව නැවත අගය කරන ලද ප්‍රමාණයෙන් ගෙනයනු ලබයි. අනෙකුත් සියලුම වත්කම්, පිරියත සහ උපකරණ වල සමුච්චිත ක්ෂය අඩුකර පිරිවැය සඳහන් කරනු ලැබේ. වෙනස් භාවිතයට ගත හැකි ජීවන කාලයක් පවතින ප්‍රධාන උපාංග වලින් පිරියත සහ උපකරණ අයිතමයක් සමන්විත වන අවස්ථාවන්හිදී, එම දේපළ, පිරියත සහ උපකරණ වල වෙනම අයිතමයක් ලෙස ගණනය කරනු ලැබේ. සෑම මූල්‍ය වර්ෂයක් අවසානයේදීම අවශ්‍ය පරිදි වත්කම් අවශේෂ වටිනාකම, ප්‍රයෝජනවත් කාලය සහ ක්ෂය කිරීමේ ක්‍රමවේදය විමර්ශනය කර සකස්කර ගනු ලැබේ.

තක්සේරුගත ප්‍රයෝජනවත් කාලයට වැඩියෙන් පිරිවැය කපා හැරීම සඳහා සින්නක්කර ඉඩම් වලට වඩා සියලුම දේපළ, පිරියත සහ උපකරණ මත ක්ෂය අයකරනු ලැබේ. බැහැර දිය හැකි දිනය දක්වා භාවිතය සඳහා වත්කම් ලබාගත හැකි දිනයන් ක්ෂය වීම් ලබා දී ඇත. තවද SLPSAS 7- දේපළ පිරියත හා උපකරණ හී විස්තරකර ඇති පරිදි පිරියත හා උපකරණ පිරිවැය ක්‍රමයට ගණනය කර ඇති බව පහත දක්වා ඇති පරිදි සරල රේඛීය ක්‍රමයක් මත පිරියත හා උපකරණ ක්ෂය ගණනය කරනු ලැබේ.

භාවිතකරන ලද මූලික වාර්ෂික අනුපාතයන් පහත පරිදි වේ;

**<u>2015</u>**

| | |
|---|---|
| යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ | වර්ෂ 10 |
| ලී භාණ්ඩ හා එහි උපකරණ | වර්ෂ 13 (7.5%) |
| පරිගණක | වර්ෂ 10 |
| වාහන | වර්ෂ 10 |
| නාම පුවරු හා වෙනත් | වර්ෂ 3 |
| පොත්පත් | වර්ෂ 5 |

තක්සේරු දෙපාර්තමේන්තුව විසින් 2013.10.02 දිනට දේපළ, පිරියත හා උපකරණ න

තක්සේරු කර ඇති 2014.01.07 දින අදාල වාර්තාව නිකුත් කරන ලදී. 2014 වර්ෂය සඳහා ක්ෂය ගණනය කිරීම 2014.01.01 දින ප්‍රතිතක්සේරුව ගණනය කිරීම ගණනය කර ඇත. වර්ෂය තුළ ස්ථාවර වත්කම් මිලදීගැනීම් පිරිවැය පදනම මත ගනනය කර ඇත.

ක්ෂය අනුපාතයේ සැලකිය යුතු වෙනසක් පවතින බවට සංඥාවක් පවතීනම්, වත්කම් අවශේෂ වටිනාකමේ ප්‍රයෝජනවත් ජීවන කාලය එම වත්කම ක්ෂයවීම නව අපේක්ෂාව ප්‍රත්‍යාවර්තනය කිරීම සඳහා සංශෝධනය කරනු ලැබේ.

මුලින් තක්සේරුගත ක්‍රියාකාරි ප්‍රමිතියෙන් අපේක්ෂිත අනාගත ආර්ථික ප්‍රතිලාභ පවත්වා ගැනීම හෝ නැවත ලබාගැනීම සඳහා දේපළ, පිරියත සහ උපකරණ පවත්වා ගැනීම පෙර නඩත්තු කිරීම් පිළිබඳ සිදුවූ වියදම දරන ලද වියදමක් ලෙස හඳුනාගනු ලැබේ.

### 3.2 ඉන්වෙන්ටරි

මූල්‍ය වර්ෂය තුළ භාවිතා කරන ලද බඩු වට්ටෝරු පිරිවැයේදී ආදායම් සහ වියදම් ප්‍රකාශනය සඳහා අයකර තිබිණි.

### 3.3 මුදල් සහ සම වටිනාකම්

මුදල් සහ සම වටිනාකම් අතති මුදල් හා බැංකුවල තැන්පත්කරන මුදල් වලින් සමන්විත වෙයි.

### 3.4 වගකීම් සහ ප්‍රතිපාදන

අතීත සිද්ධීන්ගේ ප්‍රතිඵලයක් ලෙස වර්තමාන බැදීමක් පවතින විට ශේෂ පත්‍රය තුල වගකීම් හඳුනාගනු ලැබේ. ආර්ථික ප්‍රතිලාභ මූර්තිමත් කරමින් සම්පත් පිටතට ගලායෑමක් එහි නිරවුල් කරලීමෙන් අපේක්ෂා කරනු ලබයි. ණයකරුවකුගේ ඉල්ලීම මත හෝ ශේෂ පත්‍ර දිනයෙන් වර්ෂයක් ඇතුලත ගෙවිය යුතු බැදීම ශේෂ පත්‍රයේ වර්තමාන වගකීම් ලෙස සැලකෙයි.

අතීත සිද්ධියක ප්‍රතිඵලයක් ලෙස, විශ්වාසනීය ලෙස තක්සේරු කල හැකි වර්තමාන නෛතික හෝ අනුමත බැදීමක් ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය සඳහා ඇත්නම් ප්‍රතිපාදන හඳුනාගනු ලබන අතර බැදීම් නිරවුල් කරගැනීම සඳහා ආර්ථික ප්‍රතිලාභ පිටතට ගලායෑමක් අවශ්‍ය බව හිතාගත හැකිය.

### 3.5අදායම හඳුනාගැනීම

භාණ්ඩ ලබා දී පවරා ඇති අවස්ථාවක භාණ්ඩ/සේවාවන්ගේ අළවියෙන් ආදායම හඳුනාගනු ලැබේ. සලකා බලන ලද ලැබීම් සහ ලැබිය හැකි සාධාරණ වටිනාකම්, ශ්‍රී ලංකා රජය වෙනුවෙන් එකතුකරගත් බදු ආශ්‍රිත අඩු කිරීම් හා අළවිකිරීම් දළ අගයෙන් ආදායමක් දක්වනු ලැබේ.

#### 3.5.1 ආදායම් පදනම

සහභාගිවන්නන් ගෙවීම් සිදු කිරීමේදී උපචිත පදනම මත ආදායම් ගණනය කරනු ලැබේ.නොවැළැක්විය හැකි හේතූන් නිසා සමහර සහභාගිවන්නන් විසින් සම්පූර්ණ කිරීමට පෙර පාඨමාලා අත්හරිනු ලබන අතර විවිධ හේතූන් නිසා සමහරක් පාඨමාලා ගාස්තූන් අයකරගත නොහැකිය. මෙම ලැබීම් ආදායමක් ලෙස සලකා බලා නොමැත කෙසේවෙතත්, හැකිනම් ඉතිරි ප්‍රමාණය අයකර ගැනීම සඳහා ක්‍රියා මාර්ග ගනු ලැබේ. ගිණුම් කටයුතු අවසන් කරන තුරු අදාළ වර්ෂය සඳහා ආරම්භ කරන පාඨමාලාවන් ආශ්‍රිත කිසියම් ආදායමක් උපචිත වනු ලැබේ.අවසන් වර්ෂයේ අවසන් කරන ලද කිසියම් ආදායම් එකතුකර කලින් වර්ෂයේ ගැළපීම් ලෙස සලකනු ලැබේ.

### 3.6 ලැබීම්

අයහපත් සහ සැකසහිත ලැබීම් සඳහා දළ දීමනා වටහාගැනීමට තක්සේරු කර ඇති බවට වෙළඳ ලැබීම් ප්‍රමාණයන්ගෙන් සටහන් කරන ලදී. අදාළ පාර්ශවයන්ගෙන් වෙනත් ලැබීම් හා අයවීම් අයහපත් සහ සැක සහිත ලැබීම් සඳහා දීමනාවන් පිරිවැයෙන් අඩුකරනු ලබයි.

### 3.7 නිර්වචනය කරන ලද දායක මුදල් සැළසුම්

නිර්වචනය කරන ලද දායක මුදල් සැලැස්මක් යනුවෙන් අදහස්කරන්නේ වෙනම කොටසකට ස්ථාවර දායකමුදල් ගෙවන කොටසක් යටතේ වූ පශ්චාත් සේවා නියුක්ත ප්‍රතිලාභ සැළැස්මක් වන අතර වැඩිපුර ප්‍රමාණයක් ගෙවීම සඳහා නෛතික හෝ අනුමිත බැදීමක් නොමැත.සෑම සේවකයෙක්ම ආවරණය කරනු ලබන සේවක අර්ථ සාධක අරමුදලට දායක වීම සඳහා වූ බැදීම් සිදුවූ පාඩු හෝ ලාභ වියදම් ලෙස හඳුනාගනු ලැබේ.

අර්ථ සාධක අරමුදල් සහ භාරකාර අරමුදල් ලෙස සේවකයන්ගේ දළ වේතනයන් 12% සහ 3% ක් සමාගම දායක මුදල් ගෙවයි.

### 3.8 මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

වක්‍ර ක්‍රමවේදයක් භාවිතා කරමින් මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සකස් කර ඇත.

| සටහන 4 | 2015 | 2014 |
|---|---|---|
| **පුනරාවර්තන ප්‍රතිපූර්ණය කිරීම** | රු. | රු. |
| පුනරාවර්තන ප්‍රතිපූර්ණය කිරීම | 11,555,041.38 | 9,248,657.78 |
| **මුළු එකතුව** | **11,555,041.38** | **9,248,657.78** |

| සටහන 5 | 2015 | 2014 |
|---|---|---|
| **ආදායම** | රු. | රු. |
| ඩිප්ලෝමා පාඨමාලාව | 2,899,500.00 | 3,469,300.00 |
| සහතික පාඨමාලාව | 90,000.00 | 298,500.00 |
| එක් දින වැඩසටහන | 1,653,900.00 | 1,723,300.00 |
| දෙදින වැඩසටහන | 2,286,400.00 | 1,987,600.00 |
| තෙදින වැඩසටහන | 1,389,200.00 | 1,006,000.00 |
| විශේෂ වැඩසටහන | 1,452,400.00 | 1,016,250.00 |
| විභාග ආදායම | 287,690.00 | 411,120.00 |
| සේවස්ථ වැඩසටහන | - | 347,600.00 |
| අන්තර් ජාතික කම්කරු සංවිධානයේ ව්‍යාපෘතිය | 1,100,000.00 | 2,095,000.00 |
| වෙනත් ආදායම | 2,000.00 | 103,415.00 |
| **මුළු එකතුව** | **11,161,090.00** | **12,458,085.00** |

| සටහන 6 | 2015 | 2014 |
|---|---|---|
| **සේවක වේතන** | **Rs.** | **Rs.** |
| කාර්යය මණ්ඩල වැටුප් | 559,480.27 | 164,782.91 |
| අමාත්‍යංශ කාර්යය මණ්ඩල වැටුප් | 2,310,339.00 | - |
| දෙපාර්තමේන්තු කාර්යය මණ්ඩල වැටුප් | 1,641,105.56 | - |
| අනුයුක්ත වැටුප | 527,010.00 | - |
| වැඩබැලීමේ දීමනා | 395,037.58 | 456,543.55 |
| අනුයුක්ත දීමනා | 346,327.62 | - |
| වැටුප් | 786,495.00 | 188,530.00 |
| අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ඉන්ධන | 128,700.00 | 94,810.00 |
| EPF දායකමුදල් | | |

| | | |
|---|---|---|
| EPF දායකමුදල් | 98,916.91 | 97,234.61 |
| නිවාඩුදින ගෙවීම | 14,823.14 | 14,599.59 |
| අතිකාල | 80,172.25 | 93,885.00 |
| විශ්‍රාම වැටුප් දායක මුදල් | 6,395.93 | 136,941.95 |
| පාලන මණ්ඩල වියදම් | 64,087.50 | - |
| වෙනත් දීමනා | 100,325.00 | 101,169.90 |
| විගනන සහ කළමනාකරණ කමිටු රැස්වීම් වියදම් | - | 5,000.00 |
| සාමන්‍ය විගනන ගාස්තු | - | 23,702.60 |
| කළමනාකරණ ගාස්තු | 53,280.00 | - |
| | 300,000.00 | 325,000.00 |
| **මුළු එකතුව** | **7,412,495.76** | **1,702,200.11** |

**ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය**

**31.12.2015 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශනයට සටහන්**

| සටහන 7 | 2015 | 2014 |
|---|---|---|
| ප්‍රවාහන වියදම් | රු. | රු. |
| දේශීය | 54,940.07 | 259,501.00 |
| විදේශීය | - | 129,684.07 |
| **මුළු එකතුව** | **54,940.07** | **389,185.07** |

| සටහන 8 | 2015 | 2014 |
|---|---|---|
| සැපයුම් සහ පාරිභෝගික ද්‍රව්‍ය | රු. | රු. |
| මුද්‍රණ සහ ලිපි ද්‍රව්‍ය | 334,564.35 | 1,111,060.89 |
| පුවත්පත් | 16,730.00 | 17,000.00 |
| ඉන්ධන | 92,379.80 | 160,050.00 |
| භෝජන නිළඇඳුම් | - | 8,000.00 |
| **මුළු එකතුව** | **443,674.15** | **1,296,110.89** |



| සටහන 9 | 2015 | 2014 |
|---|---|---|

| **නඩත්තු කිරීම්** | රු. | රු. |
|---|---|---|
| වායු සමන යන්ත්‍ර අළුත්වැඩියාව | 76,750.00 | 61,446.40 |
| පරිගණක නඩත්තුව | 42,120.00 | 91,950.00 |
| කාර්යාල නඩත්තුව | 499,395.38 | 400,031.07 |
| පිරියත සහ යන්ත්‍ර සූත්‍ර නඩත්තුව | - | 102,740.88 |
| වාහන නඩත්තුව | 431,259.95 | 197,542.96 |
| **මුළු එකතුව** | **1,049,525.33** | **853,711.31** |

| **සටහන 10** | **2015** | **2014** |
|---|---|---|
| **ගිවිසුම්ගත සේවාවන්** | රු. | රු. |
| ගොඩනැගිලි බද්දට දීම | 4,200,000.00 | 4,200,000.00 |
| දුරකථන | 241,845.91 | 274,506.06 |
| පවිත්‍රතා වියදම් | 1,395,058.44 | 1,293,990.87 |
| විදුලිය | 640,689.19 | 744,045.56 |
| ජලය | 95,394,99 | 49,825.74 |
| තැපල්ගාස්තු | 160,000.00 | 140,000.00 |
| සේවා ගිවිසුම් | 100,730.00 | 108,748.00 |
| ආරක්ෂක ගාස්තු | 505,032.09 | 508,219.56 |
| **මුළු එකතුව** | **7,338,750.62** | **7,319,335.79** |

**ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය**

**31.12.2015 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශනයට සටහන්**

| සටහන 11 | **2015** | **2014** |
|---|---|---|
| **ක්ෂය කිරීම** | රු. | රු. |
| යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ | 430,992.73 | 306,789.92 |
| ලී භාණ්ඩ සහ එහි උපකරණ | 292,059.08 | 249,414.28 |
| පරිගණක | 292,880.00 | 292,880.00 |
| වාහන | 125,000.00 | 125,000.00 |
| නම් පුවරු සහ වෙනත් | 347,326.67 | 351,258.67 |
| පොත් | 5,000.00 | 5,000.00 |
| **මුළු එකතුව** | **1,493,258.47** | **1,330,342.87** |

| සටහන 12 | **2015** | **2014** |
|---|---|---|
| **වෙනත් මෙහෙයුම් වියදම්** | රු. | රු. |
| වෙළඳ දැන්වීම් සහ ප්‍රවර්ධනය | 375,424.20 | 198,165.60 |
| විවිධ වියදම් | - | 13,278.00 |
| කාර්යාල සුභසාධනය | 119,840.00 | 119,945.00 |
| **මුළු එකතුව** | **495,264.20** | **331,388.60** |

| සටහන 13 | **2015** | **2014** |
|---|---|---|
| **වැඩසටහන් ක්‍රියාකාරකම්** | | |
| දැයට කිරුළ | - | 75,000.00 |
| දේශන ගාස්තු | 1,092,000.00 | 1,036,425.00 |
| ආහාරපාන | 944,855.00 | 1,103,876.56 |
| විභාග වියදම් | 271,743.00 | 319,125.00 |
| පුහුණු සහ සංවර්ධන | 7,500.00 | - |
| ත්‍යාග ප්‍රදානෝත්සවය | 205,266.40 | 12,798.00 |
| ව්‍යාපෘති වියදම් | 673,200.00 | 1,381,874.00 |
| සුනිසි වැඩ | | |

| | | |
|---|---|---|
| | - | 63,728.00 |
| **මුළු එකතුව** | **3,194,564.40** | **3,992,826.56** |

| **සටහන 14** | **2015** | **2014** |
|---|---|---|
| **<u>පිරියත සහ උපකරණ (14.1)</u>** | | |
| යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ | 3,572,144.61 | 2,761,109.28 |
| ලී භාණ්ඩ සහ අදාළ කොටස් | 3,352,647.65 | 3,077,270.73 |
| පරිගණක | 2,343,040.00 | 2,635,920.00 |
| වාහන | 1,000,000.00 | 1,125,000.00 |
| නාම පුවරු සහ වෙනත් | 249,536.06 | 649,572.73 |
| පොත් | 10,000.00 | 15,000.00 |
| **මුළු එකතුව** | **10,527,368.32** | **10,263,872.75** |

**ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය**

**31.12.2015 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශනයට සටහන්**

| **සටහන 15** | **2015** | **2014** |
|---|---|---|
| **<u>ඉන්වෙන්ටරිය(15.1)</u>** | | |
| මුද්‍රණ සහ ලිපි ද්‍රව්‍ය | 136,611.30 | - |
| කාර්යාල උපකරණ නඩත්තුකිරීම | 26,854.07 | - |
| **මුළු එකතුව** | **163,465.37** | **-** |

| **සටහන 16** | **2015** | **2014** |
|---|---|---|
| **<u>ලැබියහැකි ආදායම (16.1)</u>** | | |
| එක් දින වැඩසටහන | 132,000.00 | - |
| දෙදින වැඩසටහන | 444,000.00 | - |
| තෙදින වැඩසටහන | 152,000.00 | - |
| විශේෂ වැඩසටහන | 786,000.00 | 650,000.00 |
| ඩිප්ලෝමා පාඨමාලාව | 311,000.00 | 11,000.00 |
| ඩිප්ලෝමා ආදායම | - | 183,600.00 |
| සේවස්ථ වැඩසටහන | | |

| | | |
|---|---|---|
| අන්තර් ජාතික කම්කරු සංවිධානයේ ව්‍යාපෘතිය<br>වෙනත් ආදායම<br>වර්තන ප්‍රතිපූර්ණ<br>ප්‍රාග්ධන ප්‍රතිපූර්ණ | 1,050,000.00<br>-<br>396,919.85<br>773,841.10 | 151,000.00<br>27,435.00<br>2,924,620.42<br>1,795,799.20 |
| **මුළු එකතුව** | **4,045,760.95** | **5,743,454.62** |

| **සටහන 17** | **2015** | **2014** |
|---|---|---|
| **<u>අමාත්‍යංශ ගිණුම</u>**<br>අමාත්‍යංශ ගිණුම (17.1) | <br>89,500.00 | <br>89,500.00 |
| **මුළු එකතුව** | **89,500.00** | **89,500.00** |

| **සටහන 18** | **2015** | **2014** |
|---|---|---|
| **<u>අත්තිකාරම් ලැබීම</u>**<br>එක් දින වැඩසටහන<br>දෙදින වැඩසටහන | <br>3,000.00<br>6,000.00 | <br>-<br>- |
| **මුළු එකතුව** | 9,000.00 | - |

| **සටහන 19** | **2015** | **2014** |
|---|---|---|
| **<u>මුදල් හා ඒ හා සමාන</u>**<br>ලංකා බැංකුව පැලවත්ත A/C 0071451995 | <br>25,450,748.94 | <br>17,445,579.67 |
| **මුළු එකතුව** | **25,450,748.94** | **17,445,579.67** |

**ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය**

**31.12.2015 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශනයට සටහන්**

| **සටහන 20** | **2015** | **2014** |
|---|---|---|
| **<u>උපචිත වියදම් (20.1)</u>**<br>අතිකාල | <br>372.90 | <br>2,814.50 |

| | | |
|---|---:|---:|
| වැඩබැලීමේ දීමනා | - | 26,688.55 |
| ගෘහස්ථ ගමනාගමනය | 2,100.00 | 1,925.00 |
| විභාග වියදම් | - | 51,900.00 |
| පුවත්පත් | - | 1,540.00 |
| ආරක්ෂක ගාස්තු | 42,061.86 | 42,351.63 |
| ජලය | 15,413.43 | - |
| පිරිසිදු කිරීමේ වියදම් | 124,072.15 | 111,220.65 |
| දුරකථන | 22,163.80 | 19,030.11 |
| කාර්යය මණ්ඩල වැටුප් | - | 13,216.15 |
| වැටුප් | 12,375.00 | 8,000.00 |
| ETF | - | 427.83 |
| EPF | - | 2,756.21 |
| කාර්යාල උපකරණ නඩත්තු කිරීම | - | 9,356.00 |
| **මුළු එකතුව** | **218,559.14** | **291,226.63** |
| **සටහන 21** | **2015** | **2014** |
| **පසුගිය වර්ෂය සම්බන්ධයෙන් ප්‍රතිතක්සේරු කිරීම ගැළපීම** | | |
| ලී භාණ්ඩ සහ එහි උපකරණ | 5,161.29 | (5,161.29) |
| ක්ෂය සඳහා ප්‍රතිපාදන: ලී භාණ්ඩ සහ එහි උපකරණ | (1,161.30) | 1,161.30 |
| ක්ෂය සඳහා ප්‍රතිපාදන: නාම පුවරු හා වෙනත් | (87,390.00) | - |
| **මුළු එකතුව** | **(83,390.01)** | **(3,999.99)** |
| **සටහන 22** | **2015** | **2014** |
| **ප්‍රාග්ධන ප්‍රතිපූරණය** | | |
| ප්‍රාග්ධන ප්‍රතිපූරණය (22.1) | 1,696,391.10 | 1,847,799.20 |
| **මුළු එකතුව** | **1,696,391.10** | **1,847,799.20** |

| **සටහන 23** | **2015** | **2014** |
|---|---|---|
| **වර්තමාන වර්ෂය සඳහා ගැලපීම** | | |

| | | |
|---|---|---|
| අමාත්‍යාංශ කාර්යය මණ්ඩල වැටුප්(23.1) | 2,310,339.00 | - |
| දෙපාර්තමේන්තු කාර්යය මණ්ඩල වැටුප්(23.1) | 1,641,105.56 | - |
| **මුළු එකතුව** | **3,951,444.56** | **-** |

| **සටහන 24** | **2015** | **2014** |
|---|---|---|
| **අතිරික්ත ප්‍රතිතක්සේරු කිරීම** | | |
| ප්‍රතිතක්සේරු ගිණුම : ලී භාණ්ඩ සහ එහි උපකරණ | - | (3,386.11) |
| ප්‍රතිතක්සේරු ගිණුම: ලී භාණ්ඩ සහ එහි උපකරණ | - | 2,400.00 |
| **මුළු එකතුව** | - | **(986.11)** |

# 4.0 විගණකාධිපති වාර්තාව

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
**AUDITOR GENERAL'S DEPARTMENT**

මගේ අංකය / எனது இல. / My No. } එල්ඊඩබ්/ඒ/එන්අයිඑල්එස්/ එෆ්ඒ/2015

ඔබේ අංකය / உமது இல. / Your No. }

දිනය / திகதி / Date } 2016 ඔක්තෝබර් 18 දින

සභාපති,

ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය.

**ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනයේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව.**

---

යථෝක්ත වාර්තාව මේ සමඟ එවා ඇත.

එච්.එම්.ගාමිණී විජේසිංහ

විගණකාධිපති

පිටපත් :-

1. ලේකම් , කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යාංශය
2. ලේකම් , මුදල් අමාත්‍යාංශය.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, .- இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை.- No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34 +94-11-2887223 oaggov@sltnet.lk www.auditorgeneral.gov.lk

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
**AUDITOR GENERAL'S DEPARTMENT**

මගේ අංකය / எனது இல. / My No. } එල්ඊඩබ්/ඒ/එන්අයිඑල්එස්/එෆ්ඒ/2015    ඔබේ අංකය / உமது இல. / Your No. }    දිනය / திகதி / Date } 2016 ඔක්තෝබර් 18 දින

සභාපති,

ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය.

**ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනයේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව.**

---

ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනයේ 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 2010 අංක 12 දරන ජාතික ශ්‍රම අධ්‍යයන ආයතන පනතේ 23 වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුලත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර ආයතනයේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත්කල යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් ආයතනයේ සභාපති වෙත 2016 මැයි 19 දින නිකුත් කරන ලදී.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.



අංක 306/72, පොල්දුව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, - இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. - No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34   +94-11-2887223   oaggov@sltnet.lk   www.auditorgeneral.gov.lk

## 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000– 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදි. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරුකිරීම් ද ඇතුලත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරුකිරීම් වලදී, අවස්ථාවෝචිත උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති - 1

ප්‍රමිතිය ප්‍රකාරව ජංගම නොවන වත්කමක් ලෙස හඳුනා ගත යුතු රු.295,300 ක් වටිනා ආයතනික නාම පුවරුව අයහාර වියදමක් ලෙස ගිණුම්ගත කර තිබුණි.

#### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) උපචිත පදනම මත ගිණුම් පිළියෙල කර ඇති නමුත් ප්‍රාග්ධන වත්කම් අත්පත් කරගැනීම සඳහා වූ රු.194,805 වගකීම ගිණුම්ගත කර නොතිබුණි.

(ආ) 2011 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා කම්කරු දෙපාර්තමේන්තුවේ හා කම්කරු අමාත්‍යාංශයේ නිලධාරීන් ආයතනයෙහි සේවයේ යොදවා වැටුප් වශයෙන්රු.12,297,470 ක් වූ මුදලක් දෙපාර්තමේන්තුවේ හා අමාත්‍යාංශයේ වැය ශීර්ෂයන්ගෙන් ගෙවා තිබුණු අතර මෙම වියදම් ආයතනයේ ගිණුම් වලට ගලපා නොතිබීම නිසා ආයතනයේ සමුච්චිත අතිරික්තය සහ රජයේ දායකත්වයද මෙම වටිනාකමින් අඩුවෙන් පෙන්නුම් කෙරුණි.

(ඇ) නීත්‍යානුකූල අයිතිය පවරා නොතිබූ සංචිත වාහනයක් ලෙස භාවිතා කිරීමට අමාත්‍යාංශයෙන් ලැබී තිබූ රු.1,250,000 ක් වටිනා මෝටර් රථය ආයතනයේ වත්කමක් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂය අවසානයට සෘජු බැංකු තැන්පතු රු.50,000 ක් හඳුනාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

## 2.3 නීති රීති සහ රෙගුලාසිවලට හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

2002 නොවැම්බර් 28 දිනැති අංක IAI/2002/ 02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය පරිදි පරිගණක උපාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනයක් නඩත්තු කර නොතිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය සඳහා ආයතනයේ මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵලය රු.1,233,658 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.4,491,642 ක් වීමෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.3,257,984 ක පිරිහීමක් පෙන්නුම් කෙරුණි. පුනරාවර්තන ප්‍රදාන රු.2,306,383 කින් වැඩි වුවද සේවක පාරිශ්‍රමික වියදම් රු. 5,710,296 කින් වැඩිවීම මූල්‍ය ප්‍රතිඵලයේ පිරිහීමට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

සමාලෝචිත වර්ෂය සමඟ ඉකුත් වර්ෂ හතරක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී ආයතනයේ වියදම ඉක්ම වූ ආදායමේ අතිරික්තය අඛණ්ඩව අඩුවෙමින් පවතින අතර සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂයවීම් සැලකිල්ලට ගත්විට 2011 වර්ෂයේදී රු.7,260,727 ක් වූ ආයතනයේ දායකත්වය 2013 වර්ෂය වන විට රු.2,861,026 දක්වා අඩු වී තිබුණද 2015 වර්ෂයේ දී එය රු.9,557,107 දක්වා වර්ධනය වී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

වෘත්තීය සමිති අධ්‍යයන ආයතනයක් පිහිටුවීම, පර්යේෂණ පැවැත්වීම, සමීක්ෂණ පැවැත්වීම හා ශ්‍රී ලංකාවෙහි කම්කරු අධ්‍යාපනය ප්‍රවර්ධනය අරභයා පුහුණුව සැපයීම සහ ඒ සම්බන්ධ හෝ ඊට අනුශාංගික කරුණු ඉටු කිරීම ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනයේ ප්‍රධාන අරමුණ විය. ආයතනයේ අරමුණු ඉටු කිරීම සම්බන්ධ පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) දේශිය හෝ විදේශිය ආයතන සමඟ සහයෝගිත්වයෙන් ශ්‍රම අධ්‍යයන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, සේවකයින්ගේ සුභසාධනය සහතික කිරීම පිණිස පියවර ගැනීම සම්බන්ධයෙන් ප්‍රමාණවත් ක්‍රියාකාරකම් සමාලෝචිත වර්ෂය තුළ ක්‍රියාවට නංවා නොතිබුණි.

(ආ) ශ්‍රම අධ්‍යයනය පිළිබඳ සම්මන්ත්‍රණ, වැඩමුළු, සම්මේලන සහ රැස්වීම් පැවැත්වීම සහ සඟරා, ජර්නල්, වාර ප්‍රකාශන සහ පොත් පළකිරීම හා පර්යේෂණ පැවැත්වීම, සමීක්ෂණ පැවැත්වීම සහ ශ්‍රම අධ්‍යයනයට අදාල පාඨමාලා සඳහා විධිවිධාන යෙදීම සම්බන්ධ කිසිදු ක්‍රියාකාරකමක් වර්ෂය තුළ සිදුකර නොතිබුණි.

(ඇ) පුස්තකාල හා තොරතුරු සැපයීමේ සේවා පිහිටුවීම හා ඒවා නඩත්තු කිරීම සඳහා විධිමත් පුස්තකාලයක් ස්ථාපිත කර සිසුන්ගේ පරිහරණය සඳහා ලබා දී නොතිබූ අතර මෙම ආයතනය හා සමාන අරමුණු සහිත ජාතික හා විදේශීය ආයතන, සංවිධාන, සංගම් සහ සමිති සංගම් සමීප සහයෝගීතාවයෙන් කටයුතු කිරීම ද මෙමගින් අරමුණු කර තිබූ නමුත් එවැනි ක්‍රියාකාරකම් සිදුකර නොතිබුණි.

(ඈ) පනතේ 3(ඊ) අරමුණ ඉටු කර ගැනීම සඳහා ආයතනය විසින් සහතික සහ ඩිප්ලෝමා පඨාමලා අරම්භ කර තිබුණද ඒ සඳහා විශ්වවිද්‍යාල සහ ඒ හා සමාන ආයතනවල සහාය ලබාගෙන නොතිබුණි. ඒ නිසා ආයතනයට ලබා ගත හැකිව තිබූ කීර්තිනාමය සහ සිසුන්ට තම අධ්‍යාපනය හැදැරීම සඳහා පදනම් විභාගයක් ලෙස මෙම පාඨමාලා විශ්වවිද්‍යාල විසින් නිර්දේශ කර නොතිබුණි.

සමස්ථ කරුණු අනුව මෙම ආයතනය පිහිටුවීමේ ප්‍රධාන අරමුණු අතරින් ක්‍රියාත්මක තත්ත්වයේ පවතිනුයේ ශ්‍රම අධ්‍යයනයට අදාල පාඨමාලා පැවැත්වීම පමණක් වන අතර ආයතනය ආරම්භ කර වසර පහක් ගතවී තිබුණද පනතේ ප්‍රධාන අරමුණු 05 ක් ම ඉෂ්ඨ කර ගැනීමට අපොහොසත් වී තිබූ බව නිරීක්ෂණය විය.

**4.2 අධ්‍යයන පාඨමාලා මෙහෙයවීම**

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) විගණන පරීක්ෂාවට භාජනය වූ පාඨමාලා 9න්, පාඨමාලා 3ක් පෙර වර්ෂයට සාපේක්ෂව ආදායම් ඉපයීම සියයට 27.9කින් වර්ධනය වී තිබුණු අතර පාඨමාලා 06ක ආදායම පෙර වර්ෂයට වඩා සියයට 27.7කින් පිරිහී තිබුණි.

(ආ) පාඨමාලා විෂය නිර්දේශයට අදාලව ශිෂ්‍යයන්ගේ අවශ්‍යතා මත විෂයයන් තෝරා ගැනීමට හැකිවන පරිදි විෂය ඒකක හඳුන්වා දී නොතිබුණු අතර ස්ථාවර විෂය ඒකකයන් සිසුන් විසින් හැදැරිය යුතු වීම සහ ජාතික ශ්‍රමඅධ්‍යයන ආයතන පනතේ 3(ඊ) වගන්තිය ප්‍රකාරව විශ්වවිද්‍යාල සහ ඒ සමාන ආයතනයන්හි සහයෝගය ලබා ගැනීම දුර්වල තත්වයක පැවතීම ආයතනයේ කාර්යසාධනය කෙරෙහි බලපා ඇති බව නිරීක්ෂණය කෙරේ.

**4.3 කළමනාකරණ ක්‍රියාකාරකම්**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) පැවැත්වූ පාඨමාලාවන් සම්බන්ධයෙන් ශිෂ්‍යයන්ගේ විස්තර ඇතුලත් දත්ත ගබඩාවක් ආයතනයෙහි ස්ථාපනය කර නොතිබූ නිසා ශිෂ්‍ය අනන්‍යතාවය හා පාඨමාලා හදාරා ඇති බව තහවුරු කරගැනීමට නොහැකි වී තිබුණි.

(ආ) 2011 වර්ෂය සඳහා ආයතනයට ලැබුණු රු.89,500 ක පාඨමාලා ආදායම ශ්‍රම අධ්‍යයන ආයතනය සඳහා බැංකු ගිණුමක් ආරම්භ කර නොතිබීම හේතුවෙන් කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යාංශයේ බැංකු ගිණුමට බැරකර තිබූ අතර, එම මුදල් ලබා ගැනීමට අමාත්‍යාංශයෙන් ඉල්ලීම් කල ද විගණන දිනය වන 2016 ජූනි 09 දින තෙක් මෙම මුදල අමාත්‍යාංශයෙන් ලබා දී නොතිබුණි.

(ඇ) ලිඛිත සේවා ගිවිසුමකින් තොරව ආයතනයේ පවිත්‍රතා කටයුතු සඳහා 2014 දෙසැම්බර් 02 සිට බාහිර ආයතනයක් මගින් පවිත්‍රතා සේවාව ලබාගෙන ඇති අතර සමාලෝචිත වර්ෂය වෙනුවෙන්ද ඒ සඳහා රු. 1,135,118 ක් ගෙවා තිබුණි.

(ඈ) පාලක සභාවේ අනුමැතියකින් තොරව සම්පත් දායකයින් දෙදෙනෙකු සඳහා දේශන ගාස්තු ලෙස රු.86,400 ක් සමාලෝචිත වර්ෂයේදී ගෙවා තිබුණි.

(ඉ) 2015 වර්ෂයේ ඩිප්ලෝමා සහ සහතික පත්‍ර පිරිනැමීමේ උත්සවය සඳහා වියදම් ඇස්තමේන්තුවක් සකස් කර අනුමත කරගැනීමකින් තොරව රු. 205,266 ක වියදමක් දරා තිබුණි.

**4.4 අරමුදල් ඌන උපයෝජනය**

ඉකුත් වර්ෂ කිහිපයක සිට ජංගම ගිණුමේ සැලකිය යුතු මුදල් ශේෂයක් නිෂ්ක්‍රීයව රඳවා තිබූ අතර එය සමාලෝචිත වර්ෂය අවසානයේ රු.25,450,749 ක් විය. මෙම මුදල් ආයතනයේ අරමුණු ඉටුකර ගැනීමේ කටයුතු සඳහා යෙදවීමට ප්‍රමාණවත් අවධානයක් යොමු කර නොමැතිබව නිරීක්ෂණය විය.

**4.5 කාර්ය මණ්ඩල පරිපාලනය**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය අවසාන දිනට ආයතනයේ අනුමත සේවක සංඛ්‍යාව 45 ක් හා තත්‍ය සංඛ්‍යාව 11 ක් වීමෙන් පුරප්පාඩු සංඛ්‍යාව 34 ක් විය. සේවයේ නියුක්ත නිලධාරීන්ගෙන් 10 දෙනෙකු කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යාංශයේ සහ කම්කරු

දෙපාර්තමේන්තුවේ නිලධාරීන් වන අතර ස්ථිර සේවකයන් බඳවා ගැනීමට 2016 ජූනි මස 30 දින දක්වාම ආයතනය කටයුතු කර නොතිබුණි. මෙවැනි තත්ත්වයක් යටතේ ආයතනයේ කළමනාකරණ තීරණයන් ගැනීමටත් කාර්යයසාධනය ඉහළ මට්ටමකින් පවත්වාගෙන යාමටත් අපහසු වී ඇති බව සහ ආයතනයේ අරමුණු ඉටු කරගැනීමටත් සැලකිය යුතු බලපෑමක් සිදු වී ඇති බව පෙන්නුම් කෙරේ.

(ආ) ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනයේ අනුමත කාර්යය මණ්ඩලයේ අභ්‍යන්තර විගණන තනතුරක් ඇතිකර තිබුණද 2016 සැප්තැම්බර් 30 වන විටත් අදාල තනතුර පුරප්පාඩුව පැවතුණි.

(ඇ) ආයතනයේ රාජකාරි කටයුතු ඉටු කිරීම සඳහා කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යාංශයේ සහ කම්කරු දෙපාර්තමේන්තුවේ නිලධාරීන් අනුයුක්ත කර ඇති අතර අදාල සේවක පිරිවැය ආයතනයේ 2015 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනයෙහි සේවක වියදම් නිවැරදිව ගළපා තිබුණද අනිකුත් වර්ෂවල එසේ ගලපා නොතිබීම නිසා සේවක වියදම් වල සංගතභාවයක් නොතිබුණි.

(ඈ) ආයතනයේ පුරප්පාඩු තනතුරු 13ක් වෙනුවෙන් පුවත්පත් දැන්වීම් සඳහා 2015 පෙබරවාරි මස රු. 50,505 ක පිරිවැයක් දරා තිබුණද විගණන දිනය වූ 2016 ජූනි මස 30 වන දින දක්වාම බඳවා ගැනීම් සිදුකර නොතිබුණි.

## 5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

### 5.1 ප්‍රසම්පාදන සැලැස්ම

ආයතනය විසින් සමාලෝචිත වර්ෂයේදී අයිතම් 15ක් යටතේ රු. 2,496,000 ක ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර තිබුණි. ඒ සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු නිරීක්ෂණය කෙරේ.

(අ) ප්‍රසම්පාදන සැලැස්ම මගින් සමාලෝචිත වර්ෂය තුල මිල දී ගැනීම සඳහා සැලසුම් කළ අයිතමයන් 34 ක් මිලදී ගැනීමට කටයුතු කර නොතිබුණු අතර සැලසුම් කල ප්‍රමාණය ඉක්මවා පුටු 28 ක් සහ සහ වායු සමීකරණ යන්ත්‍ර 02 ක් මිලදී ගෙන තිබුණි.

(ආ) මේ අනුව වර්ෂයේ මිලදී ගැනීම් සඳහා වූ සැලැස්ම ඵලදායක නොවන බවත්, අයිතම වර්ග 02 ක් මිලදී ගැනීම සඳහා පමණක් රු. 2,000,269 ක වියදමක් දරා තිබූ අතර එය ඇස්තමේන්තුගත මුදලින් සියයට 80 ක් බවත් නිරීක්ෂණය වුණි.

**5.2 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම**

සමාලෝචිත වර්ෂය සඳහා සැලසුම් කල පාඨමාලා 19 ක් සම්බන්ධයෙන් කරන ලද පරීක්ෂාවේදී පාඨමාලා 12 ක් පමණක් පවත්වා තිබූ අතර සමාලෝචිත වර්ෂයේ පාඨමාලා ආදායම රු. 1,296,995 කින් අඩු වී ඇති බව නිරීක්ෂණය කෙරේ.

**5.3 විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්වීම**

2003 ජූනි 02 දිනැති අංක PED/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 7.4.1 වගන්තිය ප්‍රකාරව සමාලෝචිත වර්ෂය සඳහා විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පවත්වා නොතිබුණි.

**6. පද්ධති හා පාලනයන්**

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර ආයතනයේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කල යුතු වේ.

| | පද්ධති හා පාලන ක්ෂේත්‍රය | නිරීක්ෂණය |
|---|---|---|
| (අ) | ගිණුම්කරණ කටයුතු. | රාජ්‍ය අංශ ගිණුම් ප්‍රමිත සහ ගිණුම් කරන ප්‍රතිපත්ති තෝරා ගෙන ඒවා සංගතභාවයෙන් පවත්වා නොගැනීම. |
| (ආ) | මෙහෙයුම් කටයුතු | ආයතනයේ පොදු පරමාර්ථ ඉටු කරගැනීම සඳහා ඉලක්ක සැලසුම් කළ යුතු අතර ඒවා ළඟා කරගැනීම සඳහා ප්‍රමාණවත් උපාය මාර්ග භාවිතා නොකිරීම. |
| (ඇ) | අයවැය ලේඛනමය පාලනය. | අයවැය ලේඛනය මූල්‍ය පාලන කාරකයක් ලෙස භාවිතා නොකිරීම. |
| (ඇ) | කාර්යමණ්ඩල පරිපාලනය. | තනතුරු පුරප්පාඩු පිරවීමට කටයුතු කර නොතිබීම. |
| (ඉ) | පුස්තකාලය පරිපාලනය. | පුස්තකාල පොත් පරිහරණය කිරීම කෙරෙහි යොමු කළ යුතුය. |
| (ඊ) | ස්ථාවර වත්කම් පරිපාලනය. | වාර්ෂික සමීක්ෂණයක් නොපැවැත්වීම. |

එච්.එම්.ගාමිණී විජේසිංහ
විගණකාධිපති.